# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,474 - 2026 ජනවාරි මස 30 සිකුරාදා - 2026.01.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 32 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මාසයකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 පෙබරවාරි මස 20 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 පෙබරවාරි මස 06 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2026 ජනවාරි මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාල,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www. documents. gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


31 - B 082759 — - (2026/01)
C 1 -

# පිස්කල් විකිණීම්

**දඹුල්ල දිසා අධිකරණයේ දී ය**

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 255 වගන්තියට අනුව පිස්කල් විසින් කරනු ලබන පිස්කල් විකිණීම

සෙලාන් බැන්ක් පීඑල්සී,
(කලින් සෙලාන් බැන්ක් ලිමිටඩ් ලෙස හැඳින්වූ)
සෙලාන් ටවර්ස්,
අංක 90, ගාලු පාර, කොළඹ 03.

*............පැමිණිලිකරු.*

නඩු අංකය : 69/MB
ස්වභාවය : උකස්
පටිපාටිය : සාමාන්‍ය
වටිනාකම : රු. 2,445,328.18/-

01.සරත් දයානන්ද වෙලගෙදර,
02. දිලිකා සුවඳරත්න

*දෙදෙනාම*

අංක 76/25, සිල්වා මාවත,
දඹුල්ල.

*................විත්තිකරුවන්.*

දඹුල්ල දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2024 ක් වූ අප්‍රේල් මස 30 දින ලබාදෙන ලද නඩු තීන්දුව අනුව විත්තිකරුවන් විසින් පැමිණිලිකාර බැංකුව වෙත ගෙවිය යුතු මුදල් පැහැර හැර ඇති බැවින් පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති පරිදි රුපියල් විසි හතර ලක්ෂ හතලිස් පන් දහස් තුන්සිය විසි අටයි ශත දහඅටක (රු. 2,445,328.18) මුදලක් සහ රුපියල් විසිලක්ෂ තිස්හතර දහස් හයසිය අසූ දෙකයි ශත තිස් තුනක (රු. 2,034,682.33) මුදල මත වර්ෂ 2016.11.24 දින සිට සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන දින තෙක් වසරකට සියයට දහඅටක් (18%) බැගින් වන පොළිය ද, තව ද අධිකරණයේ නිළධාරියකු විසින් තක්සේරු කරනු ලබන නඩු ගාස්තු ද ගෙවිය යුතු බවට නියෝග කොට ඇති හෙයින් ද, ඒ අනුව ඉහත නම් සඳහන් විත්තිකරුට අයත් දැනටමත් තහනමට ගෙන ඇති පහත උපලේඛනයේ සඳහන් වන දේපළ පිස්කල් වෙන්දේසියේ විකුණා පැමිණිලිකාර බැංකුවට අයකර දීම සඳහා,

**වර්ෂ 2026 ක් වූ පෙබරවාරි මස 24 දින පෙ. ව. 11.30 ට,**

එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර, වගපනහ පල්ලේසියපත්තුවේ, දඹුල්ල නගර සහා සීමාව තුළ පිහිටි දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක E 446 පහළ ඇරැව්වල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඇරැව්වල ගමේ පිහිටි, තලකොටුව නැමැති ඉඩමේ කොටසට බලයලත් මිනින්දෝරු එච්. එච්. එම්. ටී. ආර්. විජේරත්න විසින් 1991.03.27 දින මැන සාදන ලද අංක 4215 දරන පිඹුරේ ලොට් 1 දරන ඉඩම සඳහා,

උතුරට : එච්. ජී. කුඩාරිදි අයිතිවාසියක් කියන මෙම ඉඩමේම ඉතිරි කොටස ද,
නැගෙනහිර : එච්. ජී. කුඩාරිදිට අයිති ලොට් 2 ද,
දකුණට : දඹුල්ල සිට වැවලට යන VC පාර ද,
බස්නාහිරට : ඩී. එම්. කුමාරදාස අයිතිවාසිකම් කියන කලුපිලයාය ද,

මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් දෙකයි, පර්චස් අටක් (රූ. 2 පර්. 08) වන ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගස්, වැවිලි ඇතුළු සියලු දේ සහිත ඉඩම,

මෙම ඉඩම මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 484/234 හි ලියාපදිංචි වී ඇත.

ඉහත විස්තර කරන ලද ලොට් 1 මැතක දී කළ නැවත මැනීමකින් පසුව පහත පරිදි වේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ-උතුර වගපනහ පල්ලේසියපත්තුවේ, දඹුල්ල නගර සභා සීමාව තුළ පිහිටි දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක E 446, පහළ ඇරැව්වල ග්‍රාමනිලධාරි කොට්ඨාසයේ, ඇරැව්වල ගමේ පිහිටි තලකොටුව නැමැති ඉඩමේ කොටසට බලයලත් මිනින්දෝරු ඒ. එම්. අනුරරත්න විසින් 2010.11.27 දිනයන්හි මැන සාදන ලද අංක 5077 දරන පිඹුරේ ලොට් 1 දරන ඉඩම සඳහා,

| | | |
|---|---|---|
| උතුරට | : | එච්. ජී. කුඩාරිදි අයිතිවාසිකම් කියන ඉඩම ද, |
| නැගෙනහිර | : | එච්. ජී. කුඩාරිදිට අයිතිවාසියක් කියන ඉඩම ද, |
| දකුණට | : | දඹුල්ල සිට වැවලට යන VC පාර ද, |
| බස්නාහිරට | : | ඩී. එම්. කුමාරදාස අයිතිවාසිකම් කියන ඉඩම ද, |

මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් අටක් (රූඩ් 2, පර්චස් 08) වන ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගස්, වැවිලි ඇතුලු සියලු දේ සහිත ඉඩම.

මෙම ඉඩම මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L 06/97 හි ලියාපදිංචි වී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය. (1) ගැණුම් මිලෙන් 25%, (2) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියේ (අ) යටතේ අයකිරීම් ද, ගැණුම් මිලෙන් 75% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත දඹුල්ල දිසා අධිකරණයේ ඉහත නඩුවට බැර කළ යුතුය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට පැමිණිලිකරුට අයිතිය ඇත.

*වැඩිදුර විමසීම්* : ණය අයකිරීම් අංශය, සෙලාන් බැන්ක් පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

අංකය : 011-2456485

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - දඹුල්ල.

වර්ෂ 2026 ක් වූ ජනවාරි මස 16 දින.

01-333

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.